## මව සහ මිණිබිරිය
ප්‍රේමවංශ දසනායක

සිඟිති මිණිබිරිය
දිව එයි ම වෙත
මා දුටු වනම
බදයි දෑතින් මා
අතින් ඇද රැගෙන යයි
අසුනකට

ඉනික්බිතිව
ඈ
හරි ගැසේ මා ඇකය
බහ තෝරනු පිණිස
තවත් දිගු සැසියක
තොරක් නැති පැන වැලක
ඇරඹුමකි

පිරික්සයි හතරවට
නිමිත්තක් සොයන්නට
දකී මා පිටි අත්ල
ඇඟිලිවල ලොකු කැළල

'අත්තේ, ඇයිද මේ
නුඹ ඇඟිලි කලු වෙලා?'

'ඒක දිග කතාවකි
පහසුවෙන් කිව නොහැකි
මා නුඹේ වයසේදි
සිදුව ගිය අන්තුරකි'

දිව යයි
මතකය
සොයමින්
මා මව

'පුතේ නුඹ කුඩා කල
මා නොසිටි ඇසිල්ලක
සෙල්ලමට පිහියකින්
කපා ගති නුඹේ අත

ඇඟිලිටික යන්තමට
වෙන් නොවී බේරුනා
මා හනික නුඹ රැගෙන
වෙදුන් වෙත ගිය කලට
ඔවුන් ඉඳිකටු මැහුම්
ඇඟිලි හා කරන විට
වේදනාවෙන් හඬන
නුඹ නිවා සනසන්න
තන පුඩුව මුව හොවා
කිරි දුනිමි නුඹට මම'
එවන් මව

නොමැත අද
ඇය ගොසින්
දිගු කලකි

## සුබිතා හොන්තුඥාතියෝ !
ජයතිස්ස කාරියවසම්
විශ්‍රාමික අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(නැගෙනහිර පළාත) ශ්‍රී ලංකාව

සොඳුරු උද්‍යාන විවර වී සියවස් දෙකක අතීතයේ
පුවරු පත් එසවී - හඩ නගයි වත්මනට
දහඩිය නොවෙයි අපි - තෙත් කලේ රුධිරයයි "මේ බිම
තනන්නට"

අද ඔබ විඳින සුව
අප ගෙවි පවි වලින්
පිපුණු බිගෝනියා හැස්ටිමල්
ඔබේ හද සුවඳ කොට
බිඳක් සිහිපත් කරයි නම් - ඔබ දෙපා ඔසවන
කළු දුඹුරු සුදු අපි
පොහොර වු මේ බිමට !

## පුතණුවන්
උපාලි එන් නානායක්කාර

බාල බිළිඳු වියේදීම මව් සෙනෙහස
අහිමි වු ඔබ, දහසක් දුක් ගැහැට විඳි බව
මා දැන නොසිටියෙමි පුතණුවනි

එහෙත් පසු කලෙක ඔබ රැක බලාගත් අය
ඔබට හිංසා පීඩා කල බව දැනුවත්වුදා
මගෙ ලය පැලී මිය නොගියේ ඇයිදැයි
නොදනිමි පුත

නිහතමානි අහිංසක හුරුබුහුටි දරුවෙක් වු ඔබගේ
සුන්දර වත කමල කාගේත් සිත් දිනාගත් බව
සෙනෙහසින් සිහි කල හැකිය
සේවය නිම කර නිවසට පැමිණෙන මගෙ
තුරුලට පනිනා ඔබ, බිම තැබීම අසීරු විය
ඔබ අවදිව සිටියේ නම් සේවය සඳහා මට
පිටවීමට ඔබ කිසිසේත්ම ඉඩ නොදුනි
බොහෝ දිනවල ඔබ නිවසේ තනිකර
හැර දමා ගියේ වේදනාවෙන් බරවු හදවතිනි

පාසැලේදී මා ගැන මතකය අවදි කරවන්නට
කිසිසේත්ම ඔබ ඉඩ නොදුන් බව
ගුරුතුමි පැවසු විට මා හදවතින් හඩා වැටුනෙමි
ඔබලා හදා ගැනුමට මා ගත් අපමණ වෙහෙස
මගෙ සවිය ගිලගෙන තිබුනි
අවිවේකවු මාගෙන් අතපසුවීම් ඔබ හට සිදුවු බව
මම දැන සිටියෙමි පුත
දුක් පීඩා විඳි ඔබ ගැන මතකය නිරතුරුවම
මගෙ හදවත පාරන වේදනාවක් විය

මා ඔබට දැඩිසේ ආදරය කලෙමි
දැනුදු එහි කිසිදු වෙනසක් සිදුවී නැත
දිනෙන් දින ඉතා ලස්සන කඩවසම්
දරුවෙකුවු ඔබේ දසුන දැක බලා ගැනීමට
මව නොසිටියේ කාගේ අභාග්‍යකමටදැයි
නොදනිමි
අකුරට ඔබගේ ප්‍රියතාවයක් නොතිබු බව
දැනුන විට උපේක්ෂාවෙන් ඒ දෙස බලා සිටියෙමි
එහෙත් පසු කලෙක උසස් අධ්‍යාපනය
විශිෂ්ඨ ලෙස නිමා කල විට
මගෙ බලාපොරොත්තු අපේක්ෂාවන්
මෝදුව ගොඩගැසිනි

මතු කිසියම් දවසක ඔබ වෛද්‍යවරයෙකු වී
සුවහසක් රෝගින් සුව කරනා අන්දම ගැන
සිතමින් මා දහසක් සිහින මැව්වෙමි
එහෙත් ඔබ මගෙ සිහින බොඳකරවිය
කොතෙක් සුදුසුකම් තිබුනද
ඔබ තෝරා ගත්තේ වෙනත් මාධ්‍යයකි
එහෙත් එයම ඔබ අපේක්ෂා භංගත්වයට
පත්කල බව මම දැනගතිමි
ඔබගේ ක්‍රියාදාමය මට මහත් ප්‍රහේලිකාවක් විය

බලාපොරොත්තු පොදි බැඳ ඔබ
සරසවියෙන් පිටවන තෙක්
දෑස් දල්වා බලාසිටියෙමි

උපාධි ලබා සරසවියෙන් පිටවුන ඔබ
සුදුසුකම්වලට ගැලපෙන මාවතක් සොයා
ගැනීමට ගත් අපමණ වෙහෙස
වේදනාවෙන් සිහි කරමි

ඔබ මගෙ අපේක්ෂාවන් අහිංසක පැතුමන් ගැන
මොහොතක් සිතුවේ නම් ඔබ අද ඉන්නා
තැන ඔබවත් නොදනිතියි සිතමි
එහෙත් ඔබ මගෙ ආයාචනා අළුයම ලු කෙල පිඩක් සේ
ප්‍රතික්ෂේප කෙලෙහිය
අවසන ඔබට නොගැලපෙන ස්ථානයක ඔබ
නිරතව සිටියි
කුමක් කරම්ද දෛවයට ඉඩ හරිනු මිස
මගෙ කාලය අවසන් වී ගෙන යන බව මම දනිමි
මගෙ දෙනෙත් පියවීමට පෙර ඔබගේ සිතැඟි ඉටු කරවා ගෙන
මා බලාපොරොත්තු වු උසස් ඉලක්කයක් වෙත
ඔබ යනු ඇතැයි පතමි

## මව සහ මිණිබිරිය
ප්‍රේමවංශ දසනායක

ශීත සෘතුව සෙමෙන් සමුගෙන
වසන්තය යළි උදාවු කාලයයි මේ
නිදි මතින් පාලුවු පරිසරයේ අවතාරය
කඳු එළිය වී ඇත චමත්කාරව
උදාගිරි පලාගෙන දඟ කර කර
අන්ධකාරය පලවහැර ඉරු නැගෙයි තම
කිරණ රැස් විහිදා
නිල් අහස පැහැබරය නෙත්කලුය
නිරුවත්ව සිටි තුරු වැල් හිස
හිරු කිරණ සිප වැළඳ
හරිත වර්ණයෙන් සැරසෙයි කෙමෙන්
කූඩු ගත සියොත් රැල
පියා විදා නිදහසේ සැරිසරා
මියුරු සරින් විහඟ ගී පතුරවයි දසත
නිහඬ නිසල බව අභිභවා
මල් මකරන්ද වෙත ඇදී එන
බඹර මී මැසි කැලද ගුම් හඬ පතුරවයි දසත
එලු, ගව බැටලු රංචු
පෙළ ගැසී
පුලිනතලා වෙත ඇදෙති ප්‍රීතියෙන්
උදා හිරු කිරණින්
සිනිඳු මල් කැකුළු පිබිදිලා
බිඟුන් මන්තර සුවඳ දස දෙසම පැතිරිලා
හමා එන මඳ සුළං
ගත සිතද පුබුදුකර සුව සහන ගෙනෙයි සැමට
හිරුට දයාවෙන් ලංවු වටපිටාව මොනතරම්
සුන්දරද?
හිරි වැටෙන ශීතලට මුලුගැන්ව සිටි
සතා සිවුපාවුන්ද ප්‍රීතියෙන් උදම් වී
සැරි සරයි දස දෙසම



